# බලන් හිටියා හොඳටම ඇති

ජපානයේ පැවැත්වෙන ණය කතා සඳහා කොටි සංවිධානය සහභාගි කරවා ගැනීම සඳහා සොල්හයිම් ආදී නෝර්වීජියානුවෝ ද අකාෂි වැනි ජපන් ජාතිකයෝද තිරය පිටුපස ඇමරිකන් රාජ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරීහුද කටයුතු කරති. මෙය ලොකුම රැවටිල්ලක් පමණකි. කොටි ත්‍රස්තවාදීන් නැති වුවද මේ ණය කතා (මේවා වෙනත් අරුතකින් ද ණය කතා පමණක්ම වෙයි) පැවැත්විය හැකිය. අවසානයේදී ණය ගෙවන්නේ කොටි ත්‍රස්තවාදීන් නොව ආණ්ඩුව නමින් පෙනී සිටින ආයතනයි, උතුර හා නැගෙනහිර පළාත් සංවර්ධනය කිරීම සඳහා ණය දීමට කොටි සංවිධානය අවශ්‍ය නොවේ. කොටි යනු මහජන නියෝජිතයෝ නොවෙති. ඔවුන්ට ඇත්තේ බටහිර රටවල අනුග්‍රහයෙන් සැපයුණු ආයුධය. ඔවුන් පවතින්නේ මේ ආයුධවල ශක්තිය, බටහිරින් ලැබෙන දේශපාලන සහයෝගය හා ඊනියා සිංහල දේශපාලනඥයන්ගේ කොන්ද පණ නැති කම හා දීනත්වය හේතුකොටගෙනය. මේ කරුණු එකක් හෝ නැති වූ විට කොටි සංවිධානය සුණු විසුණු කර දැමිය හැකිය.

බටහිරින් අපට පෙන්වීමට උත්සාහ කරන්නේ උතුර හා නැගෙනහිර පළාත් සංවර්ධන සඳහා ණය දීමේ දී කොටි සංවිධානය පෙනී සිටිය යුතුම බවය. කෙලින්ම නොකීව ද ඔවුහු විවිධ ක්‍රම මගින් එය ජනතාවගේ සිත් තුළට කාන්දු කිරීමට උත්සාහ කරති. ණය කතාවලට කොටි අවශ්‍යම යැයි කී විට කොටින්ට එමගින් තව තවත් ඉල්ලීම් ඉදිරිපත් කිරීමට ඉඩ කඩ සැපයෙයි. කොටි ඊනියා සාම කතාවලින් තාවකාලිකව ඉවත් වී ඇත්තේත් ණය කතාවලට සහභාගි නොවන බව කියන්නේත් විවිධ ඉල්ලීම් දිනා ගැනීමටය. අද ඔවුන්ගේ ප්‍රධාන ඉල්ලීම බවට පත්වී ඇත්තේ අන්තර්වාර පාලනයකි. මෙය එසේ මෙසේ අන්තර්වාර පාලනයක් නොවේ. තමිල්සෙල්වන්ට අනුව එය කොටින්ට පමණක් දෙන අන්තර්වාර පාලනයක් විය යුතු අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බාහිරව පිහිටුවනු ලැබුවක් ද විය යුතුය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් බාහිරව පිහිටුවන ලෙස කොටි ඉල්ලන්නේ පළමුව ව්‍යවස්ථාව තුළ අන්තර්වාර පාලනයක් ලබාදීමට ආණ්ඩුව කැමති කර ගැනීමට විය හැකිය. ඊනියා ආණ්ඩුවට එමගින් ජනතාව රැවටිය හැකි වනුද ඇත. තමන් කැමති වන්නේ ව්‍යවස්ථාව තුළ අන්තර්වාර පාලනයක් දීමට යැයි ආණ්ඩුව නම් ආයතනයේ නායකයන්ට එවිට කිව හැකි වනු ඇත. මේ සියල්ල නාට්‍ය පිටපතේ ඇති ආකාරයට සිදුවන දැය. ව්‍යවස්ථාව තුළ අන්තර්වාර පාලනය දීමෙන් පසුව ව්‍යවස්ථාවට පිටින් අන්තර්වාර පාලනයක් දීම හුදෙක් කාලය පිළිබඳ ප්‍රශ්නයක් පමණකි. චෙල්වනායගම් නම් දෙමළ ජාතිවාදියාගේ කාලයේ සිට දෙමළ ජාතිවාදීන් ප්‍රසිද්ධියේම ක්‍රියා කරන්නේ දැන් ටිකක් පසුව හුඟක් යන සූත්‍රයට අනුවය.

ව්‍යවස්ථාවෙන් පිට අන්තර්වාර පාලනය ලබාදීමට කටයුතු කළහොත් විධායක ජනාධිපති බලතල යොදා ගැනීමට බලාපොරොත්තු වන ජනාධිපතිනියටද ව්‍යවස්ථාව තුළ අන්තර්වාර පාලනය ලබා දීමට ක්‍රියා කළහොත් නිසොල්මනේ සිටිය හැකි වනු ඇත. අවසානයේදී ක්‍රම ක්‍රමයෙන් දංගෙඩිය කරා ගෙන යැමෙන් පසුව ජනාධිපතිනියට යොදා ගැනීමට ජනාධිපති බලතල ඉතුරු නොවනු ඇත. කරන දෙයක් දැන් ම කළ යුතුය. ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුවේ නාට්‍ය පිටපතට අනුව කටයුතු කිරීමෙන් ජනාධිපතිනියට හා රටට වන්නේ විනාශයක් හා විනාශයක්ම පමණි.

කොටි ත්‍රස්තවාදීන්ගේ ඉල්ලීම සම්බන්ධයෙන් බටහිරයන් ක්‍රියා කරන්නේ කෙසේදැයි විමසා බැලිය යුතුය. මේ ලිපිය ලියන මොහොත වන වන තුරුත් ඇමරිකානු රාජ්‍ය දෙපාර්තමේන්තුව ඒ සම්බන්ධයෙන් නිහඬය. මෙවැනි අවස්ථාවලදී ඇමරිකානු තානාපති විල්ස් ද බොහෝවිට මුනිවත රකියි. ඉදිරියට පැමිණෙන්නේ නෝර්වේය. එහෙත් නෝර්වීජියානුවන් ප්‍රකාශ කරන්නේ ඇමරිකාවේ මතය බව අප අමතක නොකළ යුතුය. පසුගියදා ටෝකියෝවේදීම ප්‍රකාශයක් කළ නෝර්වීජියානු අගමැතිවරයා (මෙවර අගමැතිවරයාම ටෝකියෝවේ දී ඉදිරිපත් වීමෙන් නාට්‍යයේ නාට්‍යමය ස්වභාවය වැඩිවෙයි) සඳහන් කර ඇත්තේ කොටි ත්‍රස්තවාදීන්ගේ ඉල්ලීම සම්බන්ධයෙන් ලංකාණ්ඩුව, එනම් නෝර්වේ හා වෙනත් බරහිර රටවල් මත යැපෙන ආණ්ඩුව යැයි කියැවෙන ආයතනය, නම්‍යශීලී විය යුතු බවය. කොන්දක් නැති ආණ්ඩුවකට හා එහි ප්‍රධානීන්ට ඕනෑ තරම් නැවෙන්නට හැකි බව අපි දනිමු. අපට දැනගත යුතුව ඇතතේ ආණ්ඩුව කෙතරම් නැවිය යුතුදැයි නෝර්වීජියානුවන් කියන්නේද යන්නය.

© Prof. Nalin De Silva

තව තවත් බලා සිටීමෙන් වැඩක් නැත. මේ දීන ආණ්ඩුව ලවා බටහිරයෙන් තමන්ට අවශ්‍ය සියල්ල කර ගනිති. අගමැති රනිල් වික්‍රමසිංහ කොටින්ට සොල්හයිම් අත ලිපියක් යවා ඇත. සොල්හයිම් ගෙන ගිය ලිපිය ලියන්නට ඇත්තේ කවුදැයි සිතා ගැනීම තම තම නැණ පමණින් කළ යුතුය. මේ ලිපියේ ඇත්තේ කුමක්දැයි හෙළි කිරීමට ජී. ඇල්. පීරිස් සූදානම් නැත. ඔහු පුවත්පත් සාකච්ඡාවකදී හෙළි කර ඇත්තේ ලිපිය තවමත් කොටින් අතට පත්වී නොමැති බැවින් ඒ ගැන කිසිවක් කිව නොහැකි බවය. අදීන අගමැතිවරයකු නම් කොටින්ට ලිපි ලියමින් කාලය නාස්ති නොකරනු ඇත. කළ යුතුව තිබුණේ කොටින්ගේ ඉල්ලීම නොදෙන බව ප්‍රසිද්ධියේම ප්‍රකාශ කිරීම පමණකි. ණය කතාවලට කොටි සහභාගි නොවිය යුතු බවද ඔහු කිව යුතුව තිබුණි. එහෙත් මෙරට අගමැති අදීන නැත. එබැවින් සෝල්හයිම් වැඩිම වැටුපක් ලබන ලියුම් බෙදන්නා බවට පත්වී ඇත.

මේ සොල්හයිම් ගෙන ගිය ලිපියේ කුමක් තිබේදැයි නිශ්චිතව කිව හැකි නොවේ. එහෙත් මූලික වශයෙන් එහි තිබිය හැක්කේ කොටින්ට ණය කතාවලට සහභාගි වන ලෙස කරන ආයාචනයක් (බැගෑපත්වීමක් යන්න නිවැරදි විය හැකිය.) හා ව්‍යවස්ථාව තුළ අන්තර්වාර පාලනයක් දීමට යම් ආකාරයක කැමැත්ත පළ කිරීමක් වැනිදැය. සොල්හයිම්ගේ ඊනියා වැයම වනු ඇත්තේ ලිපියේ සඳහන් කරුණුවලට ටිකක් වැඩි මට්ටමකට කොටි එකඟ කරවා ගැනීමත් ඉන්පසු ඊනියා ආණ්ඩුව ඒ නව මට්ටමට රැගෙන යෑමත්ය. එය ඒ ආකාරයෙන්ම සිදු වුණත් නැතත් මේ නාඩගම අප තව කොතෙක්කල් බලා සිටිය යුතුද? ඊනියා ආණ්ඩුව සූදානම් වන්නේ බටහිරයන්ගේ අවශ්‍යතාවය පරිදි රටේ ස්වෛරීතාවය පාවා දීමය. අද අණ්ඩුව බටහිරයන් කියන ආකාරයට නටන රූකඩයක් පමණකි. මෙය මේ රටේ ඉංග්‍රීසි කතාකරන විජාතික පංතියේ මූලික ක්‍රියාකාරීත්වයය. මින් අදහස් කරන්නේ ඉංගිරිසි කතාකරන සියල්ලන්ම එකම ආකාරයකින් කටයුතු කරන බව හෝ සිංහල කතාකරන සිංහල ලියන සියල්ලන් එයට විරුද්ධ ආකාරයකින් කටයුතු කරන බව හෝ නොවේ.

විජාතික පංතියේ ඉංගිරිසි කතා කරන්නන් මෙන්ම සිංහල කතා කරන්නෝද වෙති. මොවුන් සියල්ලන්ගේම දැකිය හැකි මූලික ලක්ෂණය නම් දීන බව, අනුකාරකත්වය හා සිතාගන්නට බැරිවීමය. මේ රටේ වත්මන් බටහිර සංස්කෘතික අධිපත්‍යය මගින් පොරවල් බවට පත් කරනු ලබන්නේ මේ ලක්ෂණවලින් සපිරි අයම වෙති.

අවාසනාවකට මෙරට විශ්වවිද්‍යාලවලින් හා පාසල්වලින් බොහෝ විට බිහි වූවෝ ද එවැන්නෝම වූහ. කලක සිංහල සාහිත්‍ය විචාරය වුවද හසුරවනු ලැබුයේ පේරාදෙණියේ ඉංගිරිසි අංශය විසිනි. ඉංගිරිසි අංශය හසුරවනු ලැබුයේ බ්‍රිතානි විශ්වවිද්‍යාලවලින් හා ඊනියා භාවිත විචාරය වැනි ඉංගිරිසි සාහිත්‍ය විචාර ක්‍රම මගින් බව අමුතුවෙන් කිව යුතු නොවේ. බෞද්ධ දර්ශනය පවා විස්තර කරනු ලැබුයේ අනුභූතිවාදය, හේතුවාදය ආදී බටහිර ප්‍රවර්ග ඔස්සේය. සමාජීය විද්‍යාවන්හි මෙය ඉතාමත් දරුණු විය. විශේෂයෙන්ම සමාජ විද්‍යාව අනුකරණයෙන් පාරාදීසයක විය. අද අණුකාරක දීනයන් අතින් මහා ඉහළින් ගරු සම්මානයට පත්වෙන ගනනාථ ඔබෙසේකර, නිව්ටන් ගුණසිංහ වැන්නන් අතින් කෙරී ඇත්තේ බහිර ප්‍රවාදවලට අනුව මෙරට සමාජය අසාර්ථකව විස්තර කිරීමය. මොවුන් දන්නේ බටහිර මානව අයිතිවාසිකම්, කසිකබල් මාක්ස්වාදය වැනි දෑය. කුඩා දරුවන් මහණ කිරීම ගැන ප්‍රශ්න කරන විට ගනනාථ ඔබෙසේකර අනාථ වන්නේ සියල්ල පෞද්ගලිකත්වය හා බටහිර පෞද්ගලිකත්වය මත පදනම වන මානව අයිතිවාසිකම හැරෙන්නට වෙනත් දෙයක් නොදන්නා නිසාය. මේ සමාජ විද්‍යාඥයෝ බටහිර මතවාද යථාර්ථය නිරූපණය කරනනේය. බටහිර දැනුම වාස්තවිකය ආදී බටහිරයන් විසින් ගොතන ලද බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික යටත්විජිතවාදී මතවාද (ප්‍රවාද ඇතුළු මතවාද - සංස්කාර වෙයි) පදනම් ව සමාජය විස්තර කරති. බටහිර මතවාද ඔස්සේ මෙරට සමාජය විස්තර කිරීමට යෑම පුද්ගලයා අනුව ඇඳුමක් මහනවා වෙනුවට ඇඳුම සඳහා පුද්ගලයාගේ ඇඟිලි අත් පා ආදිය කපා දැමීමට සමානය. බටහිර සමාජ විද්‍යාඥයකු වූ වෙබර විස්තර කරන ප්‍රොතෙස්තන්ත ආචාර ධර්ම (ප්‍රොටෙස්ටන්ට එතිකිස්) හා සාධාරණ වශයෙන් ගත්කල ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි දෙවියන් වහන්සේ විසින් මවන ලද ආත්මයක් සහිත පුද්ගලයා මත පදනම් වූ පෞද්ගලිකත්වය මත ගොඩ නැගූ මානව අයිතාවාසිකම්, නිවන කේන්ද්‍ර කරගත් අනාත්මවාදී දහමක පංචස්කන්ධවල මානව අයිතිවාසිකම් සමඟ සංසන්දනය කිරීම කෙතරම් අයෝග්‍ය ද යන්න, ඇත්තේ වාස්තවික දැනුමක් යැයිද එය බටහිර දැනුම යැයිද උපකල්පනය කරන ගනනාථලාට නොතේරෙන්නේ ඔවුන්ට හින්දු සංස්කෘතියේ ගණ දෙවි නුවණවත් නැති නිසාය. ඔවුන්ට ඇත්තේ බයිබලයේ සඳහන් සොලමන් රජුගේ නුවණේ ප්‍රභේදයකි.

© Prof. Nalin De Silva

විශ්වවිද්‍යාල පැවති මේ දීන අනුකාරකත්වය ඉතා හෙමින් නමුදු ඈත් වීමට පටන්ගෙන ඇත. අද ඉංගිරිසි අංශවල ආධිපත්‍යට සිංහල අංශ යට නොවේ. කිනම් හේතුවක් නිසා හෝ බටහිර මෝස්තරවාදී පශ්චාත්ව්‍යුහවාදී සාහිත්‍ය විචාර සිංහල අංශ විසින් අද අනුකරණය නොකෙරෙයි. මෙය ඉතා වැදගත් ලක්ෂණයි. මේ හේතුව නිසා අද ඊනියා පශ්චාත්නූතනවාදී සාහිත්‍ය විචාර සිංහල සාහිත්‍යය හා සම්බන්ධව ගත් කල අනුකරණය කෙරෙන්නේ විශ්වවිද්‍යාවලින් බාහිරවය. දරුණු හීනමානයකින් පෙළෙන සිංහල, ඉංගිරිසි හෝ පශ්චාත්නූතනවාදය හෝ දර්ශනය හෝ වෙනත් කිසිවක් නොදන්නා එක්ස් කණ්ඩායම යනුවෙන් පෙනී සිටින ඔවුහු තමන් එක්ස් නමින් හඳුන්වාගත්ත ද එක්ස් යන්නෙන් ගණිතයෙහි අදහස් කරන්නේ කුමක්දැයි වත් නොදනිති. එක්ස් ගැන ඔවුන්ගේ සඟරා කඩාමල්ලක විස්තර කරන්නට ගිය එක් මහ දැනමුත්තකු හතපොළේ ගාගෙන ඇති අයුරු මම වරක් දුටුවෙමි හිස්, හිස් වූ කිහිප දෙනකු අද පශ්චාත්නූතනවාදී දීන අනුකාරකයන් බවට පත්වී තිබෙන්නේත් සමන් වික්‍රමආරච්චි නම් විනිශ්චකාරය, බාත් කුන්දේරා (බාත් කුන්දෙරා නීතිය) මත පදනම් වී නිත්‍ය තීන්දු දෙන්නෙත් අද විශ්වවිද්‍යාල සිංහල අංශ පෙර මෙන් බටහිර මතවාද අනුකරණය කිරීමට නොපෙළඹෙන බැවිනි. බටහිරයන්ට අද ඊනියා උගත් අනුකාරකයන් සොයා ගැනීමට සිදුවී ඇත්තේ පදික වේදිකාවෙන් හා අළුත්කඩෙයෙනි. ඒ ද එකකු දෙන්නකු පමණි. ඩෙරිඩා වැනි කසිකබල් සුද්දකු (ඔහු ප්‍රංශකාරයෙකි) නිර්මාණය කරන කසිකබල් මතවාද සිංහල බුදුදහම සමග සංසන්දනය කරන විට පෙනී යන්නේ ඩෙරිඩියානු මතවාද කුඩා ළමයින් තනන කෝම්පිට්ටු වැනි බවය. ඔහුගේ ඊනියා විසංයෝජනය (ඩිකන්ස්ට්‍රක්ෂන්) යනු තවත් සංස්කරණයක් පමණකි. එය බුදු දහමේ විසංබාර සමග සංසන්දනය කිරීමට ගිය ස්වාරිස් නම් හිටපු කතෝලික පූජකවරයකු තමාට විසංයෝජනයවත් විසංබාරවත් නොතේරෙන බව පෙන්වා බටහිර විශ්වවිද්‍යාලයකින් ආචාර්ය උපාධියක් ලබාගෙන ඇත. විසංබාර ගැන නොදන්නා බටහිරයන් ඒ පිළිබඳ ආචාර්ය උපාධි දීමෙන්ම බටහිර සංස්කෘතික යටත් විජිතවාදය ක්‍රියාත්මක වන ආකාරය වටහාගත හැකිය. මෙරට විශ්වවිද්‍යාලවල සිංහල අංශ පමණක් නොව බෞද්ධ දර්ශනය හා සංස්කෘතිය පිළිබඳ අංශ ද අද ක්‍රමයෙන් බටහිර ප්‍රවර්ග නොමැතිව බුදු දහම තේරුම් ගැනීමට උත්හාස කරයි.

මෙරට දෙමළ ජාතිවාදී ප්‍රශ්නය ඉංගිරිසි කතා කළ දෙමළ නායකයන් සුද්දන්ගේ ආධාරයෙන් ඉංගිරිසි කතා කළ සිංහලයන්ට විරුද්ධව ආරම්භ කළ ව්‍යාපාරයක ප්‍රතිඵලයකි. ඉංගිරිසි කතා කළ නිවටයෝ මුල දී පරාද වූහ. මේ පරාජය ටික කලකට නැවැත්වීමට පනස් හය සමත් විය. එහෙත් හැත්තෑපහෙන් පසු නැවතත් දීන විජාතිකයෝ බලවත් වූහ. මෙයත් එයට සමාන්තර වූ දීන අනුකාරක උගතුන්ගේ ක්‍රියා කලාපයත් තව විස්තර කළ යුතුය. දැනට කිව යුත්තේ ඇමරිකන් තිර නාටකය හා නෝර්වීජියානු රඟපෑම වහාම නතර කිරීමට කාලය පැමිණ ඇති බවය. ඊනියා ආණ්ඩුව සෙප්පඩ විජ්ජා හා වචන හරඹ තුළින් බටහිරයන්ට යටත්ව බටහිර බෙර පදයට නටමින් රටේ ස්වෛරීභාවය නැති කර දැමීමට කටයුතු කරයි. යුද්දෙට නැති කඩුව කොස් කොටන්නට දැයි කීවාක් මෙන් රටේ ස්වෛරීභාවය රැක ගැනීමට නොහැකි විධායක බලතල හෙලිකොප්ටරයෙන් ගමන් යෑමටද? සොල්හයිම්ගේ ලියුම් ගණුදෙනුවේ ප්‍රතිඵල කුමක් වුවත් අද කළ යුත්තේ විධායක බලතල යොදා ආණ්ඩුව විසුරුවා හැර හෝ රටේ ස්වෛරීභාවය රැක ගැනීමය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva